# ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රකාශනය පිළිබඳ වැදගත් තොරතුරු

## 1) ඔබගේ ක්‍රෙඩිට් කාඩ් බිල්පත් ගෙවීම්

කරුණාකර ඔබේ ක්‍රෙඩිට් කාඩ් බිල්පත පියවීම සඳහා පහත සඳහන් විකල්ප භාවිත කරන්න:

### a) මුදල් මගින් ගෙවීම

මුදලින් ගෙවීම් ඕනෑම LOLC ශාඛාවක දී සිදුකළ හැකිය. කරුණාකර තැපැල් මගින් මුදල් එවීමෙන් වලකින්න. සෙනසුරාදා දිනවලදී සිදුකරන ගෙවීම් ඊළඟ වැඩකරන දිනයේ දී සැකසෙනු ඇත.

### b) චෙක්පත් මගින් ගෙවීම්

චෙක්පත් රේඛනය කළ යුතුය. (ආදායකයාගේ ගිණුමට පමණයි) එහි කාඩ්පත් අංකය ද ඇතුළත් විය යුතුය. උදා - LOLC ෆිනෑන්ස් පීඑල්සී වෙත ගෙවන්න. කාඩ්පත් අංකය oooo oooo oooo oooo කාඩ්පත් හිමියාගේ නමට ලියන ලද තෙවන පාර්ශවයේ චෙක්පත්, ඒවා ඉහත උදාහරණයේ පරිදි ලියා ඇත්නම් හැර, භාර නොගැනේ. උපලබ්ධි වීමට යටත්ව ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමෙහි මුදල් ලබාගැනීමට පවතිනු ඇත. චෙක්පත් සැකසීමට හා නිෂ්කාසනය සඳහා කරුණාකර වැඩ කරන දින තුනක අවම කාලයක් සහ වැඩ කරන දින හයක උපරිම කාලයක් ලබාදෙන්න. මුදල් චෙක්පත් සහ මතුදාතම් යෙදූ චෙක්පත් ගෙවීම් සඳහා භාර නොගැනෙනු ඇත. ගෙවීම් තැපැල් මගින් එවන ලද්දේ නම් කරුණාකර එම ගෙවීම් ඔබගේ ගිණුම වෙත ළඟා වීම සඳහා දින නවයක කාලයක් ලබාදෙන්න. සියලුම ලිපි, කළමනාකරු - Consumer Business Centre, අංක 440, හැව්ලොක් පාර, කොළඹ 05 වෙත යොමු කළ යුතුය.

### c) ස්ථාවර නියෝග

ගිණුම් හිමියෙකු හට, ස්ථාවර නියෝග ලබාදීමේ පහසුකම හරහා ඔහුගේ කාඩ්පත් ගිණුම පියවීම සඳහා සිය LOLC ෆිනෑන්ස් ඉතිරිකිරීමේ ගිණුම හර කළ හැකිය. ගෙවීම් නියමිත දිනට ප්‍රකාශන ශේෂයෙන් 5%-100% දක්වා ප්‍රතිශතයක් හර කිරීම සඳහා ඔබට තෝරාගැනීමට හැකිය.

### d) LOLC තත්කාල ගෙවීම් (LOLC REAL TIME)

LOLC ෆිනෑන්ස් සමග ඇති ඔබගේ ඉතිරි කිරීමේ ගිණුමෙන් ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට නොමිලේ මුදල් හුවමාරු කිරීමට තත්කාල ගෙවීම් භාවිත කරන්න.

### e) CEFTS ඕනෑම වෙනත් බැංකුවක් හරහා ගෙවීම්

CEFTS හරහා වෙනත් බැංකුවල ඉතුරුම්/ජංගම ගිණුම් වෙතින් ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම වෙත මුදල් මාරු කිරීම කාඩ්පත් හිමියා හට සිදුකළ හැකිය.

## 2) ගෙවිය යුතු අවම මුදල

ගෙවිය යුතු සමස්ත අවම මුදලට පහත දෑ ඇතුළත් වනු ඇත:

a) සමස්ත හිඟ මුදලින් 5%ක් හෝ රු.100ක් යන ඒවායින් වැඩි අගය.
b) ක්‍රෙඩිට් කාඩ්පතෙහි ණය සීමාවට ඉහළින් පවතින ගෙවිය යුතු යම් මුදලක්.
c) පසුගිය මාසයේ (මාසවල) නොගෙවූ / හිඟව පවතින, ගෙවිය යුතු අවම මුදලක්.
d) ස්ථාවර මාසික වාරික (සමාන මාසික වාරික)
හෝ
e) LOLC ෆිනෑන්ස් පීඑල්සී විසින් උපදෙස් දී ඇති පරිදි.

## 3) ගෙවීම් නියමිත දිනය

ප්‍රකාශනයෙහි ඉදිරිපස දක්වා ඇති යම් අවම මුදලක් මෙම දිනය වන විට ගෙවිය යුතු වේ. ගෙවීම් නියමිත දිනයට ඔබගේ ගෙවීම නොලැබුණහොත් හෝ ගෙවිය යුතු අවම මුදල නොගෙවුවහොත්, ඔබගේ කාඩ්පත් ගිණුමෙන් ප්‍රමාද ගෙවීම් ගාස්තුවක් අය කෙරනු ඇත.

## 4) ප්‍රමාද ගෙවීම් මූල්‍ය ගාස්තු

ගෙවිය යුතු අවම මුදල, ගෙවීම් නියමිත දිනට හෝ එදිනට පෙර නොලැබුණහොත්, පහත දක්වා ඇති අනුපාතික මත ප්‍රමාද ගාස්තුවක් කාඩ්පත් ගිණුම වෙත අයකෙරෙනු ඇත.

මාස්ටර්කාඩ් පල්ස් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 500/-
මාස්ටර්කාඩ් ගෝල්ඩ් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 500/-
මාස්ටර්කාඩ් ප්ලැටිනම් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 750/-
මාස්ටර්කාඩ් ව(ර්)ල්ඩ් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 1,000/-

## 5) සීමාව ඉක්මවීමේ ගාස්තුව

ප්‍රකාශන චක්‍රය තුළ ඕනෑම වේලාවකදී ක්‍රෙඩිට් කාඩ්පත් සීමාව ඉක්මවා ඇත්නම්, පහත දක්වා ඇති අනුපාතික මත සීමාව ඉක්මවීමේ ගාස්තුවක් කාඩ්පත් ගිණුම වෙත අයකෙරෙනු ඇත.

මාස්ටර්කාඩ් පල්ස් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 500/-
මාස්ටර්කාඩ් ගෝල්ඩ් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 500/-
මාස්ටර්කාඩ් ප්ලැටිනම් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 1,000/-
මාස්ටර්කාඩ් ව(ර්)ල්ඩ් ක්‍රෙඩිට් කාඩ්පත – රු. 1,500/-

## 6) මුදල් අත්තිකාරම් ගාස්තුව

ගනුදෙනු වටිනාකමින් 4%ක් හෝ රු.500/ක් යන අගයයන් අතරින් ඉහළ අගය මත මුදල් අත්තිකාරම් ගාස්තුවක් ගණනය කෙරෙනු ඇත..

## 7) මූල්‍ය ගාස්තු

සමස්ත වත්මන් ශේෂය, ගෙවීම් නියමිත දින හෝ ඊට පෙර ගෙවන ලදහොත්, ගනුදෙනු (මුදල් අත්තිකාරම් හැර) මත කිසිදු මූල්‍ය ගාස්තුවක් අය නොකෙරේ. ගෙවීම් නියමිත දිනයේ දී අර්ධ ගෙවීමක් පමණක් සිදුකළහොත් හෝ කිසිදු ගෙවීමක් නොකළහොත් හෝ, ගෙවීමක් සිදුකළ ද එය ගෙවීම් නියමිත දිනට පසුව සිදුකළහොත්, LOLC ෆිනෑන්ස් පීඑල්සී හි වර්තමාන මාසයේ පොලී අනුපාතයට අනුව දෛනික ශේෂය මත ගණනය කරන (එක් එක් ගනුදෙනුවට අදාළ ගනුදෙනු දිනවල සිට) මූල්‍ය ගාස්තුවක්, සම්පූර්ණයෙන් මුදල පියවන තෙක් නව මිල දී ගැනීම් ද ඇතුළත්ව පසුගිය ප්‍රකාශන ශේෂයට අදාළ කෙරෙනු ඇත.

මුදල් අත්තිකාරම්, මුදල් අත්තිකාරම් ගාස්තුවකට යටත් වේ. මුදල් අත්තිකාරම් සඳහා, ගනුදෙනු දිනයේ සිට සම්පූර්ණ ආපසු ගෙවීම දක්වා, මූල්‍ය ගාස්තුවක් අය කෙරෙනු ඇත. අර්ධ ගෙවීමක් පමණක් ලැබුණහොත්, පහත පරිදි මූල්‍ය ගාස්තු ගණනය කෙරෙනු ඇත:

### පොලී ගණනය කිරීමේ උදාහරණය

ප්‍රකාශන දිනය 2019/06/01 සහ ගෙවීම් නියමිත දිනය 2019/06/16

| දිනය | විස්තරය | ගනුදෙනු මුදල | ශේෂය |
|---|---|---|---|
| 02/06/2019 | ආරම්භක ශේෂය | | 10,000 |
| 10/06/2019 | මිලදී ගැනීම් | 1,000 | 11,000 |
| 16/06/2019 | ගෙවීම් | -3,000 | 8,000 |
| 01/07/2019 | කාලසීමාව සඳහා පොලිය* | 225.21 | |
| 01/07/2019 | අවසන් ශේෂය | | 8,225.21 |

| පොලිය ගණනය කිරීම* | | | | |
|---|---|---|---|---|
| දින පරාසය | ශේෂය | අනුපාතය | දින ගණන | ප්‍රතිපාදිත පොලී මුදල |
| 02/06/2019 දින සිට 09/06/2019 | 10,000 | 30% | 8 | 65.75 |
| 10/06/2019 දින සිට 15/06/2019 | 11,000 | 30% | 6 | 54.25 |
| 16/06/2019 දින සිට 01/07/2019 | 8,000 | 30% | 16 | 105.21 |
| මුළු මුදල | | | | 225.21 |

## 8) කාඩ්පත් නැතිවීම පිළිබඳ වගකීම්

කාඩ්පත නැතිවීම LOLC ෆිනෑන්ස් පීඑල්සී කාඩ්පත් මධ්‍යස්ථානය වෙත වාර්තා කිරීමට පෙර කාඩ්පත් ගිණුමෙන් අය කරන ලද සියලුම කාඩ්පත් ගනුදෙනු (අවසර දුන් හෝ නොදුන්) සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු වේ.

## 9) විදේශ ගනුදෙනු බිල්පත් සඳහා විනිමය අනුපාත

සියලුම විදේශ ගනුදෙනු MasterCard විනිමය අනුපාත භාවිත කර පරිවර්තනය කෙරෙනු ඇත. දේශීය විනිමය අනුපාත විචලනයන් පාලනය කර ගැනීම සඳහා, (2.5%ක් දක්වා) අතිරේක මුදලක් බිල්ගත කරන අවස්ථාවේ දී අනුපාතයට ඇතුළත් කෙරෙනු ඇත.